## ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය - 2015

---------------------------------------------------

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විශ්ව විද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරි වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ.තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කිරීම පිණිස විශ්ව විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

------------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල වීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 අනුව, ඉඩම් සහ ගොඩනැගිලි එකට පවරාගෙන ඇතත්, ඒවා වෙන වෙනම ගිණුම්ගත කළ යුතුය. කෙසේ වෙතත්, විශ්වවිද්‍යාලයේ 2015 දෙසැම්බර් 31 දිනට රු. 916,154,072 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම් වෙන වෙනම ගිණුම්ගත කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

මඩකලපුව දිස්ත්‍රික්කයේ පැවැති යුදමය වාතාවරණය හේතුකොට ගෙන 1990 වර්ෂය තුලදී රු.19,411,037 ක් වටිනා ලීබඩු උපකරණ, පොත් සහ මෝටර් රථ වැනි වත්කම් හානියට පත් විය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ගිණුම් පොත්වල මීට අදාළ ගැලපුම්කර නොතිබුණි. එබැවින් ස්ථාවර වත්කම්වල වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

#### 2.2.3 ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විශ්‍රාම ගිය, සේවය හැරගිය සහ විශ්වවිද්‍යාලයෙන් පිටතට මාරු වී ගිය නිලධාරීන් 307 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂ එකතුව රු.9,716,548 ක් වසර 5 කට වැඩි කාලයක් හිඟව පැවතුණි. කෙසේ වෙතත්, මෙකී හිඟ ණය ශේෂ අයකර ගැනීමට හෝ අදාළ නිලධාරීන්ට එරෙහිව නීති මාර්ගයෙන් කටයුතු කිරීමට 2016 මැයි 31 දින වන විටත් විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි.

(ආ) විදේශ සැපයුම්කරුවන්ට ගෙවන ලද එකතුව රු.5,000,378 ක අත්තිකාරම්, අයකර ගැනීමට කටයුතු කිරීමකින් තොරව ආනයන අත්තිකාරම් ගිණුම් 135 ක වසර 11 ට වැඩි කාලයක සිට පැවතුණි.

(ඇ) විවිධ සැපයුම්කරුවන්ට ගෙවන ලද එකතුව රු.18,698,666 ක් වූ අත්තිකාරම් වසර 5 සිට වසර 19 ක කාල පරාසයක් තුල අයකර ගැනීමකින් තොරව පැවතුණි.

#### 2.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වු නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| **(අ)** | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය | |
| | (i) X පරිච්ඡේදයේ 20.6 වගන්තිය | අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සේවකයන් විසින් ලබාගන්නා ලද වැටුප් රහිත නිවාඩු විස්තර පොදු 96 ආකෘති පත්‍රය මඟින් විගණකාධිපතිට මාසිකව වාර්තා කර නොතිබුණි. විශ්වවිද්‍යාල පද්ධතිය තුල මෙම පරිචය නොමැති බව උපකුලපතිවරයා විසින් මා වෙත දැනුම් දෙන ලදී. |
| | (ii) XXVII පරිච්ඡේදයේ 3.1 වගන්තිය | අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දෛනික පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා පැමිණීමේ ලේඛනයක් පවත්වා ගෙන යාමට අවශ්‍ය පියවර විශ්වවිද්‍යාලය විසින් ගෙන නොතිබුණි. සම්ප්‍රදායක් වශයෙන් අධ්‍යයන කාර්ය මණ්ඩලය ඔවුන්ගේ පැමිණීම සටහන් නොකරන බව මේ සම්බන්ධයෙන් උපකුලපතිවරයා විසින් මා වෙත දන්වන ලදී. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 396 | විශ්වවිද්‍යාලය විසින් නිකුත් කරන ලද රු.24,502 ක් වටිනා චෙක්පත් 10 ක් වර්ෂයකට වැඩි කාලයක් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වෙතත්, ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ මුළු චෙක්පත්වල වටිනාකම වූ රු.4,579,874 ක් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකර ජංගම වගකීම් ලෙස පෙන්වා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.157,502,871 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.76,652,728 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.80,850,143 ක තවදුරටත් පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී පුද්ගල පඩිනඩි සහ කොන්ත්‍රාත් සේවාවල වියදම්, පිළිවෙලින් රු.174,848,703 කින් හා රු.35,370,733 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

**(අ) විභාග ප්‍රතිඵල**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂමේ අංක 636 දරණ 1995 ජුලි 14 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ විභාග ප්‍රතිඵල, විභාගය පවත්වා මාස තුනක් ඇතුළත නිකුත් කළ යුතුය. කෙසේ වෙතත්, 2015 අප්‍රේල්, ජුලි සහ අගෝස්තු මාසවලදී පවත්වන ලද බාහිර උපාධි පාඨමාලාවල විභාග ප්‍රතිඵල සැලකිය යුතු කාල ප්‍රමාදයකින් පසුව 2016 ජුනි 8 දින නිකුත් කරන ලදී. විස්තර පහත දැක්වේ.

| පීඨය/ දෙපාර්තමේන්තුව | විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | විභාගය පැවැත්වූ මාසය | 2016 මැයි දින වනවිට ප්‍රමාදය |
|---|---|---|---|
| | | | මාස |
| වාණිජ හා කළමනාකරණ පීඨය | | | |
| 1 වසර - 2010/ 2011 | 160 | 2015 අගෝස්තු | 08 |
| 2 වසර - 2010/ 2011 (නැවත ලිවීම) | 51 | | |
| කෘෂිකර්ම පීඨය | | | |
| 1 සහ 2 වසර (නැවත ලිවීම) | 04 | 2015 ජුලි | 09 |
| හෙද දෙපාර්තමේන්තුව | | | |
| 1 වසර, 1 වැනි වර්ෂාර්ධය 2010 / 2011 ( නැවත ලිවීම) | 04 | 2015 අප්‍රේල් | 09 |

**(ආ) ශිෂ්‍යයින් බඳවාගැනීම**

සමාලෝචිත වර්ෂය තුල සහ ඉකුත් වසර තුන තුළ එක් එක් පීඨය සඳහා ඇතුළත් කරගත් ශිෂ්‍ය සංඛ්‍යාව පහත දැක්වේ.

| පීඨය | බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|
| | 2015 | 2014 | 2013 | 2012 |
| කෘෂිකර්ම | 39 | 118 | 83 | 65 |
| කලා හා සංස්කෘතික | 463 | 210 | 276 | 543 |
| වාණිජ හා කළමනාකරණ | 154 | 208 | 201 | 180 |
| විද්‍යා | 64 | 192 | 214 | 151 |
| සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා | 36 | 89 | 80 | 101 |
| එකතුව | 756 | 817 | 854 | 1040 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය තුළදී කෘෂිකර්ම සහ විද්‍යා පීඨවලට බඳවාගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යාව ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සියයට 67 කින් අඩු වී තිබූ අතර කලා සහ සංස්කෘතික පීඨයට බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 120 කින් වැඩිවිය.

(ii) සමාලෝචිත වර්ෂය තුළදී සියලුම පීඨවලට බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව 2012 වසර හා සැසඳීමේදී සියයට 27 කින් අඩු වී තිබුණි.

**(ඇ) ඒක ශිෂ්‍ය පිරිවැය**

සමාලෝචිත වර්ෂය සඳහා සහ ඉකුත් වර්ෂ තුනක කාලපරිච්ඡේදය තුළදී විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව සහ ඒක ශිෂ්‍ය පිරිවැය පහත දැක්වේ.

| | **2015** | **2014** | **2013** | **2012** |
|---|---|---|---|---|
| මුළු පිරිවැය (රු.'000) | 958,198 | 586,471 | 627,796 | 427,087 |
| මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 4,203 | 3,810 | 3,158 | 2,769 |
| ඒක ශිෂ්‍ය පිරිවැය (රු.'000) | 228 | 154 | 199 | 154 |

ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාලයේ ඒක ශිෂ්‍ය පිරිවැය සියයට 48 කින් වැඩිවිය.

## 4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) පුස්තකාල පරිපාලනය**

අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 7 දෙනෙකු විසින් රැගෙන යන ලද පුස්තකාල පොත් 27 ක් නියමිත කාලය ඇතුළත ආපසු භාර නොදී වසර 1 සිට 5 අතර කාලයක් රඳවාගෙන තිබුණි. කෙසේ වෙතත්, එකී පොත් ආපසු ලබාගැනීමට හෝ ප්‍රමාදයන් සඳහා රු.43,183 ක දඩ මුදලක් අයකරගැනීමට හෝ විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි.

**(ආ) පර්යේෂණ අත්තිකාරම් නිරවුල් කිරීම**

පර්යේෂණ පැවැත්වීම සඳහා කථිකාචාර්යවරුන් දෙදෙනෙකුට 2014 වර්ෂයේදී ගෙවන ලද පර්යේෂණ ආධාර අත්තිකාරම් රු.82,850 ක් 2016 ජූනි 30 දින වන විටත් පියවා නොතිබුණි. කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

**(ඇ) අධ්‍යයන කටයුතු සඳහා නිවාඩු ලබාදීම**

කලා සහ සංස්කෘතික පීඨයේ 1 ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකුට එකී පීඨයේ ආචාර්ය උපාධි වැඩසටහනක් කරගෙන යාම සඳහා 2010 ඔක්තෝබර් 01 දින සිට 2011 මාර්තු 31 දින දක්වා අධ්‍යයන නිවාඩු ප්‍රදානය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2010 ඔක්තෝබර් 01 දින විශ්වවිද්‍යාලය සමඟ එළඹි බැඳුම්කර ගිවිසුම අනුව ඇයගේ අධ්‍යයන නිවාඩු නිම කළ පසු විශ්වවිද්‍යාලයට අනිවාර්ය අවුරුදු 5 ක සේවයක් සැලසිය යුතුය. කෙසේ වෙතත්, ඇයගේ ආචාර්ය උපාධිය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව 2014 පෙබරවාරි 11 දින සිට බලපැවැත්වෙන පරිදි 2015 ජනවාරි 29 දින ඇය සේවයෙන් විශ්‍රාම යන ලදී. මේ සම්බන්ධයෙන් රු.2,534,659 ක් වූ බැඳුම්කර වටිනාකම ඇපකරුගෙන් අයකර ගැනීමට විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි.

(ii) ඇයගේ විශ්‍රාම යන දිනය දක්වා වූ විශ්වවිද්‍යාලයේ සේවය කළ හැකි ඉතිරි සේවා කාලය සැලකිල්ලට නොගෙන, නිවාඩු සහ ප්‍රදාන කමිටුව විසින් එකී කථිකාචාර්යවරියට ආචාර්ය උපාධි වැඩසටහන කරගෙන යාම සඳහා පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු අනුමත කර තිබුණි.

(iii) 2011 අප්‍රේල් 20 දිනැති අංක 01/ 2011 දරන උසස් අධ්‍යාපන චක්‍රලේඛය සහ 2014 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව අධ්‍යයන කාර්ය මණ්ඩලය ඔවුන්ගේ පර්යේෂණ දීමනාව ලබාගැනීමට පර්යේෂණ යෝජනා, පර්යේෂණ කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, ඉහත සඳහන් කථිකාචාර්යවරිය පර්යේෂණ කටයුතු සඳහා අළුත් යෝජනාවක් ඉදිරිපත් නොකර 2011 සිට 2015 දක්වා වසර 5 ක කාලපරිච්ඡේදය සඳහා පර්යේෂණ දීමනා වශයෙන් එකතුව රු.923,708 ක් ලබාගෙන තිබුණි.

**(ඇ) බැඳුම්කර කඩකිරීම**

---------------------

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු ඉන්දියාවේ මද්‍රාසි විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධි වැඩසටහන සඳහා 2012 මාර්තු 05 දින, උසස් අධ්‍යාපනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයෙන් (NCAS) රු.368,500 ක ප්‍රදානයක් ලබාගන්නා ලදී. නමුත් ඔහු 2016 ජූනි 30 දින වනතුරුත් ආචාර්ය උපාධිය සම්පූර්ණ කර නොතිබුණි. කෙසේ වෙතත්, විශ්වවිද්‍යාලය විසින් රු.368,500 ක බැඳුම්කර වටිනාකම ගිවිසුම ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.3 කළමනාකරණ දුබලතා

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 ජූනි මස 24 දින පැවැති විගණන කමිටු රැස්වීම අනුව, පරිගණක 155 ක් හා යූපී-එස් 06 ක් ප්‍රසම්පාදනයේදී සිදු වූ රු.4,233,370 ක පාඩුව ඊට වගකිවයුතු නිලධාරීන් තිදෙනෙකුගෙන් අයකර ගැනීමට නිර්දේශ කර තිබුණි. කෙසේ වෙතත්, 2016 මැයි 31 වනතුරුත් එකී පාඩුව අයකරගෙන නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරුන් 73 දෙනෙකු ශිෂ්‍යත්ව මත විදේශගත වී තිබූ නමුත් එය නිම වූ පසු ආපසු රාජකාරී සඳහා වාර්තාකර නොතිබුණි. කෙසේ වෙතත්, ඔවුන්ගෙන් අයවිය යුතු එකතුව රු.156,535,552 ක මුදල වසර 5 සිට වසර 20 අතර කාල පරාසයක් තුල හිඟව පැවතියත් විශ්වවිද්‍යාලය විසින් ගිවිසුම් කඩකිරීම මත පැන නැඟුණු එකී ශේෂ ඔවුන්ගෙන් හෝ ඔවුන්ගේ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙයින් සිද්ධි 12 ක් සම්බන්ධයෙන් නීතිමය කටයුතු කර පැහැර හැරී අයගෙන් අයකරගැනීමට නීතිපතිවරයා වෙත භාර දී ඇති බව මේ සම්බන්ධයෙන් උප කුලපතිවරයා මා වෙත දන්වන ලදී.

(ඇ) ත්‍රිකුණාමලය මණ්ඩපයේ 2014 වර්ෂයේ සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව නිවාඩු නිකේතනයේ, ඩොක්යාර්ඩ් පාර නේවාසිකාගාරය, ආපන ශාලාව සහ මණ්ඩපයේ නඩත්තු අංශයේ රු.මිලියන 1.19 ක් වටිනා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ 167 ක් නැතිවී ඇති බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව විශ්වවිද්‍යාලය විසින් නැතිවීමට හේතු සොයා බැලීමට හෝ එකී අලාභයට වගකිවයුත්තන්ට වගකීම පැවරීමට හෝ කටයුතු කර නොතිබුණි.

**4.4 කොන්ත්‍රාත් පරිපාලනය**

**ත්‍රිකුණාමලය මණ්ඩපයේ ක්‍රීඩා පිටියක් ඉදිකිරීම**

2014 අප්‍රේල් 19 දින පිරිවැය රු.32,447,463 කට ත්‍රිකුණාමලය ක්‍රීඩාපිටිය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව කොන්ත්‍රාත්කරුවකුට පවරා තිබුණු අතර කොන්ත්‍රාත්කරු රු.24,765,167 ක මුදලක් ලබාගැනීමෙන් පසු ඉදිකිරීම් වැඩ අත්හැර දමා තිබුණි. කෙසේ වෙතත්, විශ්වවිද්‍යාලය විසින් වලංගු කාලය තුල කාර්යසාධන බැඳුම්කරය මුදල් කර කොන්ත්‍රාත්කරු අසාදු ලේඛනගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**4.5 මානව සම්පත් කළමනාකරණය**

මහාචාර්යවරුන් 19 දෙනෙකුගේ සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හා කථිකාචාර්යවරුන් 65 දෙනෙකුගේ පුරප්පාඩු පැවැති අතර මෙම තත්ත්වය ශිෂ්‍ය ප්‍රජාවගේ අධ්‍යයන කටයුතු සඳහා හානිකර ලෙස බලපා තිබුණි. කෙසේ වෙතත්, මෙකී තනතුරුවල පුරප්පාඩු පිරවීමට විශ්වවිද්‍යාලය 2016 ජූලි 31 දින වනතුරුත් විධිමත් පියවර ගෙන නොතිබුණි.

**4.6 වත්කම් කළමනාකරණය**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) "Tissue Processor" හි ප්‍රධාන උපාංගයක් මිලදී නොගැනීම හේතු කොටගෙන 2012 වර්ෂයේදී රු.මිලියන 2.875 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද "Eight accessories of the tissue processor" නැමැති වෛද්‍ය උපකරණ මිලදී ගත් දින සිට සෞඛ්‍යාරක්ෂක විද්‍යා පීඨයේ නිශ්ක්‍රීයව පැවතුණි.

(ආ) විශ්වවිද්‍යාලය විසින් 2012 ජූලි 04 දින රු.2,994,370 ක් වටිනා "mortuary cooling chamber" නැමැති වෛද්‍ය උපකරණයක් මිලදීගෙන මානව ජීව විද්‍යා දෙපාර්තමේන්තුවේ කායච්ඡේද විද්‍යා රසායනාගාරයට භාර දී තිබුණු නමුත් විශ්වවිද්‍යාලය විසින් එකී උපකරණය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය 10KV UPS උපාංගය සපයා නොතිබුණි. එබැවින් එය 2016 අප්‍රේල් 07 දින දක්වා නිශ්ක්‍රීයව පැවතුණි.

**5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන, මුදල් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, විශ්වවිද්‍යාලයේ සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කරන ලද්දේ 2016 අප්‍රේල් 04 දිනදීය.

**5.2 සංයුක්ත සැලැස්ම**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 වගන්තිය පරිදි ඉකුත් වර්ෂ තුනක මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳව සමාලෝචනයක් සංයුක්ත සැලැස්මෙහි ඇතුළත් කර නොතිබුණි. තවද ඉටුකරගත යුතු ඉලක්කවල මූල්‍යමය වටිනාකම් එහි පිළිබිඹු නොකෙරුණු අතර ඒ නිසා වාර්ෂික ප්‍රගතිය ඇගයීය හැකි වන ආකාරයෙන් සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

**5.3 ක්‍රියාකාරී සැලැස්ම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරණ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ 4 ඡේදය අනුව විශ්වවිද්‍යාලය විසින් පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මෙහි විශ්වවිද්‍යාලයේ යාවත්කාලීන කළ සංවිධාන සැලැස්මට වර්තමාන අනුමත හා තථ්‍ය කාර්යමණ්ඩලය හා අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුළත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් භෞතික ප්‍රගතිය මැනීම සඳහා විශ්වවිද්‍යාලය විසින් කාර්යසාධන වාර්තා පිළියෙල කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට කලා හා සංස්කෘතික පීඨය විශ්වවිද්‍යාලය විසින් ඇතුලත් කර නොතිබුණි.

**5.4 ප්‍රසම්පාදන සැලැස්ම**

ප්‍රසම්පාදන මාර්ගෝපදේශයෙහි 4.2.1 (අ) සහ 4.2.3 වගන්ති ප්‍රකාරව යටත් පිරිසෙන් වර්ෂ තුනක කාලපරිච්ඡේදයක් තුලදීවත් ඉටුකරගැනීමට අපේක්ෂිත කාර්යයන් ඇතුළත් කරමින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. ඒ වෙනුවට, වර්ෂයක කාලයක් සඳහා පමණක් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණි.

**5.5 පිළිතුරු නොසැපයූ විගණන විමසුම්**

2015 වර්ෂයේ ජූනි මාසයේදී නිකුත් කරන ලද විගණන විමසුම් 24 කින් තුනකට 2016 ජූනි 30 දින වන විටත් පිළිතුරු සපයා නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ස්ථාවර වත්කම් පාලනය - සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම්වල සාධාරණ අගය ඉදිරිපත් කිරීම.

(ආ) කොන්ත්‍රාත් පරිපාලනය - ප්‍රමාද වන්දි අයකර ගැනීම, කාලය දීර්ඝ කිරීම් අනුමත කිරීම සහ කොන්ත්‍රාත් ගිවිසුම්වල කොන්දේසි වලට අනුකූල වීම.